# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,078 - 2018 ජුනි මස 29 වැනි සිකුරාදා - 2018.06.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1412 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

*සැ. යු.* - (i) අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත් කෙටුම්පත 2018 ජුනි මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජුනි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූලි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූලි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1409 - B 81425 — 5,403 (2018/06)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## වාරිමාර්ග, ජල සම්පත් කළමනාකරණ හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර සඳහා වන විවෘත තරග විභාගය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර පුරප්පාඩු සඳහා සෘජු බඳවා ගැනීම යටතේ අයදුම්පත් කැඳවනු ලැබේ.

මීට යාකර ඇති අයදුම්පත්‍ර අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.08.02 වැනි දින හෝ ඊට පෙරාතුව ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, අංක 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලිපිනය වෙත ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ උඩ වම්පස කෙළවරේ ''ඉංජිනේරු සහකාර සේවය III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර (**සෘජු බඳවා ගැනීම**)'' යනුවෙන් සඳහන් කළ යුතුය.

මෙම දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(අ) සියලුම බඳවා ගැනීම් අංක 15/90 දරන රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛ ප්‍රකාර සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කෙරෙනු ඇත.

(ආ) ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුලු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයකට භාජනයකර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ලිඛිත විභාගයේ විෂය නිර්දේශය පහත පරිදි වේ. :-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය** (සිතීමේ තර්කානුකූලතාවයත් විශ්ලේෂණ හැකියාවත් තීරණ ගැනීමේ ශක්තියත්, විනිශ්චය කිරීමත් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.) | පැය 1 | 100 | 40 |
| **තාක්ෂණ ප්‍රශ්න පත්‍රය** (මූලික වීජ ගණිතය, ඛණ්ඩාංක ජ්‍යාමිතිය, කලනය, ත්‍රිකෝණමිතිය හා ද්‍රවස්ථිතිය, ස්ථිති විද්‍යාව, විද්‍යුතය, යාන්ත්‍ර විද්‍යාව, තාපය, සංඛ්‍යානය ආදී කොටස් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.) | පැය 2 | 100 | 40 |

2. (*අ*) *අධ්‍යාපන සුදුසුකම්* :

(I) සිංහල /දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය විද්‍යාව සහ තවත් විෂයයන් එකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සමග

(II) පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යාවහාරික ගණිතය හා රසායන විද්‍යාව යන ක්ෂේත්‍රයට අදාළ විෂයයන්ගෙන් එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම;

හෝ

(III) නව නිර්දේශය අනුව, උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් තුනකින් එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම.

(*ආ*) *වෘත්තීය සුදුසුකම්* :

(I) ගල්ගමුව, කොත්මලේ වාරිමාර්ග අභ්‍යාස ආයතනයක වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකය ලබා තිබීම.

හෝ

(II) මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(III) මට්ටක්කුලිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(IV) කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(V) විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව හදාරා (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම;

හෝ

(VI) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉහත පාඨමාලාවන්ට සමාන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. (මෙම පාඨමාලා NVQ 6 මට්ටමේ විය යුතුය.)

3. *වෙනත් සුදුසුකම්* :

(I) 2018.08.02 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතුය. (පළාත් සහ රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් කෙරෙහි ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.)

(II) ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(III) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(IV) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(V) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

4. *සේවා කොන්දේසි* :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුව සිදු වන අතර, වැන්දඹු හා විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකර ගනු ලැබේ.

(ආ) අයදුම්කරුවන් ප්‍රථම වශයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන්නේ ආධුනියකන් වශයෙනි.

(ඇ) බඳවා ගන්නා ලද ආධුනිකයන්හට න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුලත් වන සේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන හය මසක සේවාස්ථ පුහුණුවක් ලබාදෙනු ලැබේ. ඉන් අනතුරුව පවත්වනු ලබන න්‍යායික හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වීමේදී දක්වන කුසලතාවය මත ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය වේ.

(ඈ) සෘජු බඳවා ගැනීම් යටතේ බඳවා ගන්නා ආධුනිකයන් හට, පුහුණුව ලබන මාස හයක කාල සීමාව සඳහා මසකට රුපියල් 22008.00 ක දීමනාවක් ගෙවනු ලැබේ. මෙම දීමනාව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අවසරය පරිදි දීර්ඝ කරනු ලබන පුහුණුවීමේ කාල පරිච්ඡේදයේ දී ලැබීමට හිමිකම් ඇත. පුහුණු කාලය තුළ වෙනත් වරප්‍රසාද හෝ හිමිකම් කිසිවක් නොලැබේ.

(ඉ) වාරිමාර්ග ආධුනිකයින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට හා රජය මඟින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසි වලට යටත් විය යුතුය. පුහුණුව ලබන කාල සීමාව තුළදී ඔවුනට නිවාඩු හෝ දුම්රිය බලපත් ලැබීමට හිමිකම් නැත.

(ඊ) සියලුම දේශන හා පුහුණු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

(උ) පුහුණුව සාර්ථකව අවසාන කරන අයදුම්කරුවන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරට පත් කරනු ලැබේ.

(ඌ) මෙම පත්වීම් ආධුනික කාලය සම්පූර්ණ කරන ලදුව III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර විධිමත් පත්වීම් භාරගත් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(එ) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් වසර 05ක අනිවාර්ය සේවා කාලයක් ඉංජිනේරු සහකාර තනතුරේ සේවය කරන බවට ගිවිසුමකට අත්සන් කළ යුතුය. ඊට පෙර සේවයෙන් ඉවත් වීමට අවශ්‍ය වුවහොත් ගිවිසුමේ සඳහන් මුදල රජයට ගෙවිය යුතුය.

5. වැටුප් ක්‍රමය - පුහුණුවීම් කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු මෙම තනතුර සඳහා මාසික ඒකාබද්ධ වැටුප් තලය MN3- 2016 සහ වැටුප් පරිමාණය (රා.ප.ච. 03/2016 අනුව) රුපියල් 31040-10x445-11x660-10x730-10x750-57550/- වේ. (රු. 31930/- වාර්ෂික වැටුප් පියවරට පූර්වයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ඇත.)

6. අයදුම්කරු අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතිකවල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

- ලබාගෙන ඇති තාක්ෂණික සහතිකයන්,
- අ.පො.ස (උසස් පෙළ) සහතික පත්‍රය,
- අ.පො.ස (සාමාන්‍ය පෙළ) සහතික පත්‍රය,
- රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතිකය

- ➢ අවසන් වරට ඉගෙන ගත් විදුහලේ විදුහල්පතිගෙන් ලබා ගන්නා චරිත සහතිකය,
- ➢ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් (ඩීඑස් 4 ආකෘතිය) චරිත සහතිකය,

*සටහන* - ඉහත සඳහන් සහතිකවල පිටපත් ආපසු ලබා දෙනු නොලැබේ.

7. පළාත් සහ රාජ්‍ය සේවාවන්හි නියුතු සේවකයින් ඔවුන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතුය.

8. අයදුම්කරුවන්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන ලිඛිත විභාගයකට සහ සම්මුඛ පරීක්ෂණයකට ඔවුන්ගේ ම වියදමින් පෙනී සිටිය යුතුය.

9. සේවා අවශ්‍යතාවය මත ඕනෑම අවස්ථාවක දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය. දෙපාර්තමේන්තුවේ වැඩබිම් බොහෝවිට ප්‍රවාහන සහ නවාතැන් පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති බව අයදුම්කරුවන් වටහා ගත යුතුය. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් දුෂ්කර ප්‍රදේශවලට අනුයුක්ත කරන අතර අවම වශයෙන් වසර පහක් (05) එවැනි ප්‍රදේශයක රාජකාරී කළ යුතුය.

10. අයදුම්කරුවන් සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබීමට පියවර ගනු ඇත. එබඳු අසත්‍ය තොරතුරක් බඳවාගනු ලැබීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් ඔහුගේ සේවය අවසන් කෙරෙනු ඇත. මීට අමතරව අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට එරෙහිව නීති මඟින් දඬුවම් ලබාදීමට සිදුවනු ඇත.

ඉංජි. එස්. මෝහන රාජා,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2018 ජූනි මස 13 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

*වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය*
*වාරිමාර්ග දෙපාර්තමේන්තුව*
*වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර සඳහා වන විවෘත තරග විභාගය*

1. (*අ*) සම්පූර්ණ නම :————.

(*ආ*) මුලකුරු සමග නම :————.

2. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

3. (*අ*) ලිපිනය :————.
(*ආ*) ස්ථිර පදිංචි ලිපිනය :————.
(*ඇ*) දුරකථන අංකය : ස්ථාවර :————.
ජංගම :————.
(*ඈ*) විද්‍යුත් තැපැල ලිපිනය :————.

4. පදිංචි දිස්ත්‍රික්කය :————.

5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

6. උපන් දිනය : (උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න)

(*අ*) අවුරුද්ද :————; මාසය :————; දිනය :————.
(*ආ*) උපන් ස්ථානය :————.
(*ඇ*) 2018.08.02 දිනට වයස :

අවුරුදු :————; මාස :————; දින :————.

7. ජාතික හැඳුනුම්පත් අංකය :————.

8. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? ඔව්/ නැත :————.

ජාතිය : සිංහල ☐ මුස්ලිම් ☐
ශ්‍රී ලාංකික ද්‍රවිඩ ☐ වෙනත් ☐
ඉන්දියානු ද්‍රවිඩ ☐

9. අධ්‍යාපනික සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණන්න)

9.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය :

පළමුවර :

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

දෙවැනිවර (අවශ්‍ය නම්) ඃ

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

9.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය :

විභාග අංකය :————. අවුරුද්ද :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

10. තාක්ෂණික සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණන්න)

.....................................................

(පාඨමාලාව හා කාර්මික විදුහලේ නම සඳහන් කරන්න)

11. ඔබ කලින් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය කොට සේවය අතහැර ගියේද/ අස්වූයේ ද/ සේවය නතර කරනු ලැබුවේ ද/ සේවයෙන් පහකරනු ලැබුවේද ? එසේ නම් ඊට හේතු :————.

12. ඔබ දැනට රැකියාවක යෙදී ඇත්නම් ඒ පිළිබඳ විස්තර ඃ

(අ) තනතුර :————.

(ආ) ආයතනය :————.

(ඇ) පත්වීම් ලද දිනය :————.

(ඈ) පත්වීමේ ස්වභාවය (ස්ථිර/ තාවකාලික/අනියම්) :————.

13. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මෙයින් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රජයේ දෙපාර්තමේන්තුවක/පළාත් රාජ්‍ය සේවයක අයදුම්කරුවන් සඳහා පමණි.)

.................................... මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, මෙම තනතුරට අයදුම් කිරීම සඳහා නියමිත අවශ්‍යතාවයන් හා කොන්දේසිවලට අනුකූල බවත්, මෙයින් සහතික කරමි. ඔහු/ ඇය තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත්, වැඩි දුරටත් සඳහන් කර සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

06 - 1124

---

## උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### රාජ්‍ය සංගීත කණ්ඩායමේ සංගීත ශිල්පී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සංගීත කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ අයදුම්පත් 2018.07.31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සංගීත ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන්

පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම දැන්වීම www.culturaldept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය.

01. සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි :

I. කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතර වසර 03ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කෙරේ.
II. වැටුප රු. 33,600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

02. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

I. අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගයේදී සංගීත විෂය ඇතුළුව විෂයයන් තුන (03) කින් සමත් වීම.

*හා*

ජාතික සංගීත අවසාන විභාගය සමත්වීම හෝ භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය සමත්වීම.

*හෝ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සංගීත විෂය සම්බන්ධව උපාධියක් ලබා තිබීම.

II. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.
(යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

III. පළපුරුද්ද :
රජය විසින් පිළිගත් කලායතනයක හෝ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ඊට සමාන ආයතනයක් වශයෙන් පිළිගනු ලබන කලායතනයක සංගීත ශිල්පියෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්ද

*හෝ*

පාරම්පරික සංගීත ශිල්පියකු වීම (ලිඛිතව සනාථ කළ යුතුය.)

IV. කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙක්ම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
ii. උස අඩි 5 යි අඟල් 3 කට නො අඩු විය යුතුය.

V. වෙනත් සුදුසුකම් :
i. සියළුම අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
ii. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
iii. ගායන/වාදන සියළුම අංශවල ප්‍රවීනතාවය සළකනු ලැබේ.

03. වයස් සීමාව :අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

04. බඳවා ගැනීමේ ක්‍රමය :
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා භාජනය කරන අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් සහ වෘත්තීය පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. අදාළ ක්ෂේත්‍ර තුළ ලබා ඇති පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය.) | 35 | |
| 3. වෘත්තීය සුදුසුකම් :<br>i. ප්‍රවීණ ශිල්පීන් යටතේ ජාතික තලයේ නිර්මාණවලට සහභාගි වී තිබීම.<br>ii. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් හෝ ප්‍රවීණ ශිල්පීන් සමඟින් විදේශ ප්‍රසංගවලට සහභාගි වී තිබීම | 25 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

වෘත්තීය පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ප්‍රධාන විෂය (ගායනය/වාදනය) | 60 | 30 |
| 2. අනු විෂය (ගායන ශිල්පීන් සඳහා වාදන/වාදන ශිල්පීන් සඳහා ගායනය) | 20 | 10 |
| 3. ස්වර ප්‍රස්ථාර කියවීමේ/ලිවීමේ හැකියාව | 20 | 10 |
| එකතුව | 100 | 50 |

05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :
අයදුම්පත්‍ර පිරවීමේදී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුලත් කළ යුතු අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.
1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. තනතුරු ලබාගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

07. අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරැදි යැයි යමකු තෝරාගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද පත්කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

08. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අනූෂා ගෝකුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2018 ජූනි මස 12 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

***සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංගීත ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් කිරීම***

01. මුලකුරු සමඟ නම :————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

03. උපන් දිනය :————.

04. වයස (2018.07.31 දිනට) :————.

05. උස : අඩි ………… අඟල් …………

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. ස්ත්‍රී / පුරුෂ භාවය :————.

08. ලිපිනය :————.

09. දුරකතන අංකය :————.

10. අධ්‍යාපන සුදුසුකම් :————.

i. අ.පො.ස. (උ/පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

ii. ලබාගත් උපාධිය ඃ

| වලංගු වන දිනය | ක්ෂේත්‍රය | ආයතනය/විශ්වවිද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

iii. ජාතික සංගීත අවසාන විභාගය/භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය

| වලංගු වන දිනය | සමත් විභාගය | ආයතනය/විශ්වවිද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් :————.

12. පළපුරුද්ද :————.

මෙම අයදුම් පත්‍රයේ මවිසින් සපයා ඇති සියළු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06 - 1011

## සංශෝධනයයි

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අංක 2,073-2018 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස II(අ) ඡේදය යටතේ පළ වූ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වැනි ශ්‍රේණිය සඳහා වෘත්තීය සුදුසුකම් හා කුසලතා මත සෘජු බඳවා ගැනීම 2016 - දැන්වීමේ පළමු ඡේදයේ සඳහන් අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2018 ජූලි මස 25 දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

දැනටමත් අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ හෝ රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත ගෙනැවිත් භාරදුන් අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පද්මසිරි ජයමාන්න,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා<br>
සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2018 ජුනි මස 25 වැනි දින,<br>
කොළඹ දී ය.

06-1157

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.